සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	11 ශ්‍රේණිය	**ව්‍යවසායකත්ව අධ්‍යයනය I -II**	කාලය / நேரம் / Time: පැය 03 යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

අමතර කියවීම් සඳහා කාලය මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී පුමුඛතවය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස් -

- **සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිලිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් තෝරා පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

01. අනාගතය වෙනස් කිරීමට පොළඹවන්නා වූ පුද්ගලයන්ගේ මානස්ක තත්ත්වය
(1) නවෝත්පාදනය යි.
(2) නිර්මාණශීලීත්වය යි.
(3) ව්‍යවසායකත්වය යි.
(4) නම්‍යශීලීත්වය යි.

02. ව්‍යාවසායකත්ව සංකල්පය ක්‍රියාවට පරිවර්තනය කිරීමේ දී වැදගත්වන ව්‍යවසායකත්ව ගතිලක්ෂණ වනුයේ,
(1) නවෝත්පාදනය, අවධානම් දැරීම, නිර්මාණශීලීත්වය
(2) නවෝත්පාදනය, නිර්මාණශීලීත්වය, අවධානම් දැරීම,
(3) අවධානම් දැරීම, අනාගත දැක්ම, නිර්මාණශීලීත්වය
(4) අනාගත දැක්ම, නවෝත්පාදනය, නිර්මාණශීලීත්වය

03. යන්ත්‍රසූත්‍ර, ඉංජිනේරුවරයෙකුගේ ශ්‍රමය, තීරණ ගැනීම අමුද්‍රව්‍ය යනාදිය තුළින් හඳුනාගත හැකි නිෂ්පාදන සාධක පිළිවෙලින් දැක්වූ විට,
(1) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යාවසායකත්වය
(2) ව්‍යාවසායකත්වය, ශ්‍රමය,භූමිය,ප්‍රාග්ධනය
(3) ප්‍රාග්ධනය,ශ්‍රමය,ව්‍යාවසායකත්වය,භූමිය
(4) භූමිය,ශ්‍රමය, ව්‍යාවසායකත්වය,ප්‍රාග්ධනය

04. ගනුදෙනුකරුවන් පෝලිම්වල කල්ගත කිරීමට අකමැති බවත්, ක්ෂණිකව ස්වකීය කාර්යයන් ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් සිටින බවත් වටහා ගත් ව්‍යාවසායකයෝ ස්වයං සේවා වෙළඳසැල්, අන්තර්ජාල වෙළඳසැල්, විද්‍යුත් ගෙවීම් වැනි නවෝත්පාදන හඳුන්වා දීම,
(1) නවෝත්පාදනය යි
(2) නිර්මාණශීලීත්වය යි
(3) අවධානම් දැරීම යි
(4) නම්‍යශීලීත්වය යි

Past Papers Wiki

04. ගනුදෙනුකරුවන් පෝලිම්වල කල්ගත කිරීමට අකමැති බවත්, ක්ෂණිකව ස්වකීය කාර්යයන් ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් සිටින බවත් වටහා ගත් ව්‍යාවසායකයෝ ස්වයං සේවා වෙළඳසැල්, අන්තර්ජාල වෙළඳසැල්, විද්‍යුත් ගෙවීම් වැනි නවෝත්පාදන හඳුන්වා දීම,

(1) නවෝත්පාදනය යි
(2) නිර්මාණශීලීත්වය යි
(3) අවධානම් දැරීම යි
(4) නම්‍යශීලීත්වය යි

05. වුවමනා පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) නිවාස, බත්, දුරකථනය, අධ්‍යාපනය
(2) බිස්කට්,මහල් නිවාස, රූපවාහිනිය, කමිසය
(3) ආහාර, සාය, ආරක්ෂාව, ඖෂධ
(4) සෞඛ්‍ය, අධ්‍යාපන, විනෝදය, ආහාර

06. මානව අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා වන ඕනෑම ආර්ථික කටයුත්තක් පොදුවේ හැඳින්විය හැක්කේ,

(1) ව්‍යාපාර සංවිධානයක් ලෙසය.
(2) ව්‍යාපාරයක් ලෙසය.
(3) නවෝත්පාදනයක් ලෙසය.
(4) වෙළඳපොලක් ලෙසය.

07. බොහෝ රටවල් සංවර්ධිත තත්ත්වයට පත්ව ඇත්තේ ව්‍යවසායකත්ව ප්‍රතිලාභ හේතුවෙනි. ඒ අනුව, ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයාට ලැබෙන ප්‍රතිලාභයක් නොවන්නේ

(1) ස්වයංපෝෂිත බව
(2) ස්වකීය දෛවය තමා මතම රඳා පැවතීම
(3) ආකර්ෂණීය ලාභයක් ඉපැයීම
(4) ආදායම් බෙදීයාමේ විෂමතාවය අඩුවීම

08. වර්තමානයේදී වෙළඳපොළ තුළ ක්‍රියාත්මක වන මහා පරිමාණ ව්‍යාපාර වෙළඳපොලේ පවතින කුඩා පරිමාණ ව්‍යාපාර අවස්ථා කෙරෙහි උනන්දු නොවේ. මෙහි ප්‍රතිඵල වනුයේ,

(1) භාණ්ඩ ආනයනය වැඩිවීමය.
(2) වෙළඳපොලේ පවතින හිඳැස නිර්මාණය වීමය.
(3) ආදේශක භාණ්ඩ වෙළඳපොළට පැමිණීමය.
(4) නවෝත්පාදන බිහිවීමය.

09. ව්‍යාපාරයක් ආරම්භකොට පවත්වාගෙන යාමේ දී එම ක්‍රියාකාරීත්වයට බාධා පමුණුවන හෝ ක්‍රියාකාරීත්වය සීමා කරවන සාධකයක් වනුයේ ,

(1) භාණ්ඩ ආනයනය හා අපනයන වැඩිවීමය.
(2) වෙළඳපොලේ පවතින හිඳැස නිර්මාණය වීමය.
(3) ආදේශක භාණ්ඩ වෙළඳපොළට පැමිණීමය.
(4) නවෝත්පාදන බිහිවීමය.

10. ව්‍යවසායකයෙකු විසින් ව්‍යාපාරයේ සේවා අවශ්‍යතාව සඳහා නවක සේවකයින් කිහිපදෙනෙකු බඳවා ගැනීම අයත්වන ව්‍යවසායකත්ව භූමිකාව වනුයේ,

(1) නායකයාගේ භූමිකාව
(2) කළමනාකරුගේ භූමිකාව
(3) අයිතිකරුගේ භූමිකාව
(4) සේවකයාගේ භූමිකාව

11. ව්‍යාපාරයේ පුද්ගල කණ්ඩායම් සමඟ වැඩ කිරීමේ දී අදහස් හුවමාරු කර ගැනීමට ඇති හැකියාව හඳුන්වනුයේ,

(1) සන්නිවේදන කුසලතාවය ලෙසය
(2) මානව කුසලතාවය ලෙසය
(3) උපදේශන කුසලතාවය ලෙසය
(4) සංකල්පනාත්මක කුසලතාවය ලෙසය.

12. ව්‍යාපාර කටයුතු වල නිරතවන ව්‍යවසායකයින්ට නිවැරදි තීරණ ගැනීම සඳහා පසුබිම සකසන්නේ,

(1) ව්‍යාපාරයේ කළමනාකරුවන්
(2) ව්‍යාපාර අවස්ථාවන්
(3) ව්‍යාපාර පරිසර සාධක
(4) ව්‍යාපාර සැලසුම් ය.

13. ව්‍යාපාර ආයතනයේ කටයුතුවලට බලපෑම් කරනු ලබන ව්‍යාපාරයට අයත් පිටතින් ඇති සියළුම සාධක බාහිර පරිසර සාධක වේ. බාහිර පරිසර සාධක විශ්ලේෂණය තුළින් හඳුනා ගත හැකි වන්නේ,

(1) ව්‍යාපාර අවස්ථා හා තර්ජන
(2) ව්‍යාපාරයේ දුර්වලතා හා අවස්ථා
(3) ව්‍යාපාර ශක්තීන් හා දුර්වලතා
(4) ව්‍යාපාර තර්ජන හා ශක්තීන්

14. පසුගිය කාලසීමාව තුළ වාණිජ බැංකු හා අනෙක් සියළුම බැංකු ඇතුළු මූල්‍ය ආයතනවල පවත්වාගෙන යනු ලබන ඉතුරුම් හා ස්ථාවර තැන්පතු මත ගෙවනු ලබන පොලී ආදායමින් 10% ක ප්‍රමාණයක් අයකර ගැනීමට රජය තීරණය කරන ලදි. මේ සඳහා අදාළ පරිසර සාධකය වනුයේ,

(1) ආර්ථික පරිසරය
(2) ගෝලීය පරිසරය
(3) ආසන්න පරිසරය
(4) දේශපාලන හා නෛතික පරිසරය

15. ශ්‍රී ලංකා ආර්ථිකයේ තෘතීයක අංශයට අයත් ව්‍යාපාරයක් වනුයේ,

(1) සැමන් නිෂ්පාදනය
(2) ගව පාලනය
(3) රක්ෂණ සේවා සැපයීම
(4) ගොඩනැගිලි ඉදිකිරීම

16. අමාලි උපන් දින හා වෙනත් උත්සව සඳහා කේක් සකස් කර දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ඇය තම පාරිභෝගිකයන්ගෙන් ඇණවුම් භාරගෙන නිවසට හෝ සේවා ස්ථානයට හෝ ගෙන ගොස් භාර දෙයි. මෙය,

(1) පවතින භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපොලට ඉදිරිපත් කිරීම.
(2) පවතින භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපොලට ඉදිරිපත් කිරීම.
(3) නව භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපොළට ඉදිරිපත් කිරීම.
(4) නව භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපොළට ඉදිරිපත් කිරීම.

17. වෙළඳපොලෙහි පාරිභෝගියන්ගෙන් කොටසක් තෘප්තිමත් නොවූ අවශ්‍යතා හා වුවමනා සහිතව පසුවේ. මෙම තත්ත්වය හැඳින්විය හැක්කේ,

(1) වෙළඳපොළ භිදැස ලෙසය.
(2) වෙළඳපොළ ඉල්ලුම ලෙසය.
(3) ව්‍යාපාර අවස්ථා ලෙසය.
(4) නිෂ්පාදිත ප්‍රභේදන ලෙසය.

18. ජනනය කරගන්නා ලද ව්‍යාපාර අදහස් ගණනක යම් යම් සාධක මතු පිටින් සලකා බලා තෝරා ගන්නා ලද එම ව්‍යාපාර අදහස් කිහිපය ඉතා ගැඹුරින් අධ්‍යයනය කිරීම,

(1) සාර්ව විශ්ලේෂණයයි
(2) සූක්ෂ්ම විශ්ලේෂණයයි.
(3) ශබ්ද අත විශ්ලේෂණයයි.
(4) යෝග්‍යතා විශ්ලේෂණයයි.

19. නව සොයා ගැනීම් වෙළඳපොලට ඉදිරිපත් කළ පසු එය තවදුරටත් රහසක් නොවී අන්අයට උපුටාගත හැකිය. එබැවින් නව සොයා ගැනීමක අයිතිය ආරක්ෂා කිරීම සඳහා ලබා ගත යුත්තේ,

(1) පේටන්ට් බලපත්‍රය
(2) ස්වාධිකාරය
(3) පුරස්කාරය
(4) වගකීම් සහතිකය

20.

X තීරුව	**Y තීරුව**
1. යල් පැන ගිය තාක්ෂණය	A අවස්ථා
2. රාජ්‍ය දිරිගැන්වීම	B තර්ජන
3. නිෂ්පාදිත වල ගුණත්වය	C දුර්වලතා
4. අනවශ්‍ය දේශපාලන මැදිහත්වීම	D ශක්තීන්

ඉහත X තීරුවේ තොරතුරු තොරතුරු සමඟ ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) 1B, 2C, 3A, 4D
(2) 1C, 2A, 3D, 4B
(3) 1A, 2C, 3D, 4B
(4) 1D, 2B, 3C, 4A

21. ඉදිරිපත් කිරීමට අපේක්ෂිත භාණ්ඩය හෝ සේවාව සඳහා ඇති ඉල්ලුම, ඉලක්ක පාරිභෝගිකයා, තරඟකරුවන්ගේ ස්වභාවය හා ඔවුන්ගේ අලෙවිකරණ උපක්‍රම ආදිය පිළිබඳව ගැඹුරින් සොයා බැලීම,

(1) ශබ්ද අත විශ්ලේෂණය
(2) සාර්ව විශ්ලේෂණය
(3) වෙළඳපොළ විශ්ලේෂණය
(4) විකිණුම් විශ්ලේෂණය

22. පහත සඳහන් කරුණු අතරින් අලෙවි සැලැස්මක ඇතුළත් කළ යුතු තොරතුරුවලට අදාළ අක්ෂර කාණ්ඩය වනුයේ,

A - විකිණුම් පුරෝකතනය
B - නිෂ්පාදන පිරිවැය
C - වෙලඳපොළ විශ්ලේෂණය
D - අලෙවි ස්ථාවර වත්කම්

(1) ACD (2) ABC (3) BCD (4) ඉහත සියල්ලම

23. භාණ්ඩයක ඉල්ලුම කෙරෙහි ද ව්‍යවසායකයාගේ ලාභය කෙරෙහි ද බලපාන ප්‍රධාන සාධකය වනුයේ
(1) භාණ්ඩයේ ගුණත්වය
(2) භාණ්ඩයේ ප්‍රමිතිය
(3) භාණ්ඩයේ මිල
(4) භාණ්ඩයේ වෙළඳ නාමය

24. තම භාණ්ඩය හෝ සේවාව මිලදී ලනු ඇතැයි අපේක්ෂා කරන හෝ අනාගතයේදී මිලදී ගැනීම සඳහා පොළඹවා ගැනීමට හැකි වේ යැයි අපේක්ෂිත පුද්ගල සමූහය,
(1) සැපයුම්කරුවන්
(2) තරඟකරුවන්
(3) ප්‍රවර්ධකයින්
(4) ඉලක්ක පාරිභෝගිකයින්

25. සමස්ථ ව්‍යාපාර සැලැස්මේ පදනම ලෙස සළකනුයේ,
(1) අලෙවි සැලැස්ම (2) නිෂ්පාදන සැලැස්ම (3) මූල්‍ය සැලැස්ම (4) පරිපාලන සැලැස්ම

26. යම් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය වන සම්පත් හඳුන්වනුයේ,
(1) නිෂ්පාදන සාධක ලෙසය. (2) යෙදවුම් ලෙසය. (3) නිමවුම ලෙසය. (4) ද්‍රව්‍ය පිරිවැය ලෙසය.

27. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය තුළ ක්‍රියාත්මක වන ප්‍රධාන සාධකය වන්නේ,
(1) පාරිභෝගිකයන්
(2) අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්
(3) භෞතික සම්පත්
(4) තරඟකරුවන්

28. ව්‍යවසායකයින් විසින් නිර්මාණය කර සම්පූර්ණ කරනුයේ පුද්ගල,
(1) අවශ්‍යතා ය. (2) අරමුණුය (3) පරමාර්ථය (4) චුවමනාය.

29. ව්‍යාපාර ආයතනයක ගොඩනැගිලි කුලී, දුරකථන වියදම්, තැපැල් වියදම්, වරිපනම් බදු ආදි වියදම් අයත්වනුයේ,
(1) නිෂ්පාදන වියදම්
(2) පරිපාලන වියදම්
(3) මූල්‍ය වියදම්
(4) පරිපාලන නොවන වියදම්

30. ආයතනය තුළ ඉහළ තනතුරු දරණ එමෙන්ම ව්‍යවසායකත්ව ගුණාංග ඇති පුද්ගලයෝ අභ්‍යන්තර (ආයතනික) ව්‍යවසායකයින් ලෙස හැඳින්වේ. ඒ අනුව එම ව්‍යවසායකයින් වැදගත් වනුයේ,
(1) සමාජයේ විවිධ ගැටළු වලට නිර්මාණාත්මක විසඳුම් ඉදිරිපත් කිරීම නිසාය.
(2) පවතින සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගන්නා නිසාය.
(3) ලාභ අපේක්ෂාවෙන් ව්‍යාපාර කටයුතු වල නිරතවන නිසාය.
(4) තම ආයතනය අන් ආයතනවලට ආදර්ශ ලබා දෙන ආකාරයට වෙනස් කරන නිසාය.

31. සමාධි විසින් ආරම්භ කිරීමට අපේක්ෂිත පාවහන් ව්‍යාපාරයේ ව්‍යාපාර සැලැස්මෙන් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

	රු.
විකිණුම් ආදායම	500 000.00
පරිපාලන වියදම්	50 000.00
නිෂ්පාදන පිරිවැය	330 000.00
අලෙවි වියදම්	50 000.00

ඉහත තොරතුරුවලට අනුව පාවහන් ව්‍යාපාරයේ අපේක්ෂිත ප්‍රතිඵලය වනුයේ,

(1) රු. 70 000.00 (2) රු.45 000.00 (3) රු.50 000.00 (4) රු.170 000.00

32. ව්‍යාපාරයේ සංවිධාන ව්‍යුහය, භිමිකාරීත්වය, අධ්‍යක්ෂ මණ්ඩලය ආදි තොරතුරු ඇතුළත් වන්නේ,

(1) සංස්ථා ප්‍රකාශයේය. (2) සංවිධාන සැලැස්මෙය.

(3) පරිපාලන සැලැස්මේ ය. (4) සංගමික ව්‍යවස්ථාවලියේය.

33. හවුල් ව්‍යාපාරයක ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනුයේ,

(1) පළාත් සභාව විසිනි. (2) ප්‍රාදේශීය ලේකම් විසිනි.

(3) ග්‍රාම නිලධාරි විසිනි. (4) සමාගම් රෙජිස්ට්‍රාර් විසිනි.

34. කේවල ස්වාමි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර හා සංස්ථාපිත සමාගම් ලෙස ව්‍යාපාර වර්ගීකරණය කිරීමේ පදනම වනුයේ,

(1) අරමුණු අනුව (2) පරිමාණය අනුව

(3) භිමිකාරත්වය අනුව (4) ආර්ථිකයට වන දායකත්වය අනුව

35. හවුල් ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යාම සඳහා ඇති කර ගන්නා ගිවිසුම්ගත ලිඛිත එකඟතාවය,

(1) හවුල් ගිවිසුමයි. (2) හවුල් ව්‍යාපාර ආඥා පනතයි.

(3) හවුල් ඔප්පුවයි. (4) සංගමික ව්‍යවස්ථාවලියයි.

36. වරලත් හිමියා විසින් තම වෙළඳ නාමය යටතේ භාණ්ඩ හා සේවා විකිණීමට වරලත්ලාභියාට ලබා දෙන අවසරය මත අය කරන ගාස්තුව,

(1) බදු කුලියයි. (2) වරිපනම් ගාස්තුය. (3) වට්ටම් මුදලයි. (4) පුරස්කාරයයි.

37. ව්‍යාපාරයක ක්‍රියාත්මක වන සමාජය විසින් නිවැරදි යැයි පිළිගනු ලබන ලිඛිත හෝ ව්‍යාංග රීති වලට අනුකූල වීම අයත් වන සමාජ වගකීම් මට්ටම වනුයේ,

(1) ආර්ථික මට්ටම (2) සදාචාරාත්මක මට්ටම (3) නීතිමය මට්ටම (4) පරාර්ථකාමී මට්ටම

38. ව්‍යාපාරයකට තම අයිතිකරුවන් කෙරෙහි මෙන්ම ව්‍යාපාරය ක්‍රියාත්මක වන හා පෝෂණය වන සමස්ථ බාහිර සමාජය කෙරෙහිම වගකීමක් ඇති බව ව්‍යාපාර සමාජ වගකීම යන්නෙන් අදහස් වේ. ඒ අනුව සමාජ වගකීම පිළිපැදීමෙන් ලබන ප්‍රතිලාභයක් නොවන්නේ,

(1) ව්‍යාපාරයේ කීර්තිනාමය වර්ධනය වීම.

(2) ව්‍යාපාරයේ දිගුකාලීන පැවැත්ම තහවුරු වීම.

(3) පැන නැඟිය හැකි නීතිමය ප්‍රශ්න වැඩිවීම.

(4) සේවක චිත්ත ධෛර්යය ඉහළ යාම.

39. ව්‍යාපාරයන් සඳහා ක්‍රියාත්මක වන බොහෝ දිරිගැන්වීම් පවති. ඒ අතරින් ව්‍යාපාරයක් සඳහා විකුණුම් ප්‍රවර්ධනයට උපදෙස් ලබා දීම අයත්වනුයේ,

(1) අලෙවි පහසුකම් සැපයීමක් ලෙසය.

(2) තාක්ෂණික සේවා ලබා දීමක් ලෙසය.

(3) උපදේශන සේවා පහසුකම් ලබා දීමක් ලෙසය..

(4) වෙළඳපොළ පහසුකම් ලබා දීමක් ලෙසය.

PAST PAPERS Wiki

40. පහත දැක්වෙන්නේ එක්තරා ඇඟළුම් නිෂ්පාදන ව්‍යාපාරයක හිමිකරු විසින් ඔහුගේ ව්‍යාපාරය පිළිබඳව දක්වන ලද ප්‍රකාශයකි. එනම් ඇඟළුම් ලොව ප්‍රමුඛයා වීම. මෙය මෙම ආයතනයේ

(1) අනාගත දැක්මයි. (2) ව්‍යාපාර ප්‍රතිපත්තියයි

(3) ව්‍යාපාර අරමුණයි. (4) ව්‍යාපාරයේ පරමාර්ථයයි

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை -2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	11 ශ්‍රේණිය	කාලය / நேரம் / Time
	ව්‍යවසායකත්ව අධ්‍යයනය I -II	

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

උපදෙස්

- ❖ **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- ❖ **පළමු ප්‍රශ්නය ඇතුළුව ඕනෑම ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. දකුණු ආසියානු ඔලිම්පික් මලල ක්‍රීඩා තරඟාවලිය ඉන්දියාවේ රංචිහි දී 2025 ඔක්තෝම්බර් 26 දින අවසන් විය. ශ්‍රී ලංකාවට අනුශූරතාවය හිමි වූ අතර දකුණු ආසියාවේ වේගවත්ම ක්‍රීඩිකාව ලෙස මහනුවර විහාරමහා දේවී විද්‍යාලයේ සඟියා යාමිත් ක්‍රීඩිකාව විරුදාවලිය ලැබුවාය. 2028 පැවැත්වීමට නියමිත ඔලිම්පික් තරඟය ජය ගැනීම ඇයගේ එකම අභිප්‍රායයි.

මෙම ප්‍රවෘත්තිය රූපවාහිනිය තුළින් නැරඹූ පවන්, තම පියාට අයත් ක්‍රීඩා භාණ්ඩ අලෙවි කිරීමේ ව්‍යාපාරය, කායවර්ධන මධ්‍යස්ථානයක් දක්වා තවදුරටත් පුළුල් කිරීම පිළිබඳ පියා සමග සාකච්ඡා කරන ලදි. එහිදී පවන්ගේ පියා මෙම ව්‍යාපාර අදහස පිලිබඳ සතුට ප්‍රකාශ කරමින් පැවසූඅවේ තම ප්‍රදේශයේ ක්‍රීඩා භාණ්ඩ අලෙවිකිරීමේ මධ්‍යස්ථානයක් නොමැති බැවින් මෙය සාර්ථක ව්‍යාපාර අවස්ථාවක් බවට පරිවර්තනය කළ හැකි බවයි. තමා අධ්‍යාපනය හැදෑරූ පාසලේ ක්‍රීඩාවට හපන්කම් දක්වන දරුදැරියන්ට කායවර්ධන උපදෙස් හා අවස්ථා නොමිලයේ ලබා දිය හැකි බවත් පවන්ගේ අදහසයි.

තමා ඉතිරි කරගත් මුදල් රු 1 000 000 ක මුදලක් ආයෝජනය කිරීමටත්, ක්‍රීඩා භාණ්ඩ අලෙවි කිරීමේ ව්‍යාපාරයට යාබඳ ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගැනීමටත්, ව්‍යාපාර සැලැස්ම සකස් කර 6% පොලියක් යටතේ රු.1 000 000 බැංකු ණයක් ලබා ගැනීමටත් බැංකු ණය මුදලෙන් කායවර්ධන උපකරණ මිලදී ගැනීමටත් පවන්ගේ පියා තීරණය කරන ලදි.

පවන් විසින් කායවර්ධන මධ්‍යස්ථානය සඳහා පළපුරුදු උපදේශකවරයෙකු බඳවා ගැනීමට හා පුහුණු සේවකයින් දෙදෙනෙකු බඳවා ගැනීමට කටයුතු කළේ, ව්‍යාපාර අදහස ව්‍යාපාර අවස්ථාවක් බවට පත්කර ගත හැකිවීම පිළිබඳව බලවත් සතුටකිනි.

i. පවන් සතුව පවතින ව්‍යවසායකත්ව ගතිලක්ෂණ 02 ක් ලියන්න.
ii. (අ) පවන්ට මෙම ව්‍යාපාර අදහස ඇතිවීමට හේතුව කුමක්ද?
(ආ) යෝජිත ව්‍යාපාරයේ ඉලක්කගත පාරිභෝගිකයින් කවුරුන්ද?
iii. යෝජිත ව්‍යාපාරය සතු ශක්තීන් 02 ක් ලියන්න.
iv. මෙම ව්‍යාපාරයෙන් සපුරාලන මිනිස් අවශ්‍යතාව හා චුවමනාව සඳහන් කරන්න.
v. යෝජිත ව්‍යාපාරයෙන් ව්‍යවසායකයාට හා දේශීය ආර්ථිකයකට හිමිවන ප්‍රතිලාභය බැගින් ලියන්න

පවන්ගේ යෝජිත ව්‍යාපාර සැලැස්මෙන් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

අයිතමය	රු.
ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම	20 000.00
ව්‍යාපාරය ලියාපදිංචි කිරීම	25 000.00
කායවර්ධන උපකරණ මිලට ගැනීම	500 000.00
ගොඩනැගිලි කුලී	50 000.00
කායවර්ධන උපදේශක වැටුප්	100 000.00
සේවකයින් දෙදෙනාගේ වැටුප්	80 000.00
සේවා සැපයීමෙන් ලද ආදායම්	200 000.00
ක්‍රීඩා භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම්	200 000.00

ඉහත තොරතුරු ඇසුරෙන් පහත දෑ ගණනය කරන්න.

vi. මුළු ස්ථාවර වත්කම් වල වටිනාකම
vii. ආරම්භ කිරීමට පෙර වියදම්
viii. පවන්ගේ ව්‍යාපාරයේ මුදල් ගලාඒම් දෙකක් හා මුදල් ගලා යාම් දෙකක් දක්වන්න.

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

ix. ඇස්තමේන්තුගත මුළු ආයෝජනය
x. අපේක්ෂිත මූල්‍ය වියදම (ලකුණු 02*10 = 20)

02. "ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ යෙදී සිටින්නා ව්‍යවසායකයා ය."

i. මෙහි කියැවෙන ව්‍යවසායකත්වය හා සම්බන්ධ ක්‍රියාවලිය ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.
ii. භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රියාවලියට ව්‍යවසායකයෙකු භාවිතා කරන නිෂ්පාදන සාධක 04 ක් නම් කරන්න.
iii. ව්‍යවසායකයෙකුට තම භාණ්ඩ හා සේවා උත්පාදනය සඳහා පදනම් විය හැකි මූලාශ්‍ර 02 ක් සඳහන් කරන්න.
iv. ව්‍යවසායකයා ව්‍යාපාරිකයාගෙන් වෙන්කොට හඳුනාගත හැකි ලක්ෂණ 02 ක් ලියන්න.
v. ඔබ දන්නා ව්‍යවසායකයින් වර්ග 02 ක් ලියන්න. (ලකුණු 02*5)

03. රටක් සංවර්ධනය කිරීම රජයකට පමණක් තනිව කළ හැකි කාර්යයක් නොවේ. ඒ සඳහා ව්‍යවසායකයින්ගේ දායකත්වය ද වැදගත් වේ.

i. ව්‍යවසායකයින් නිසා දේශීය ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ 04 ක් ලියන්න.
ii. බොහෝමයක් කුඩා ව්‍යවසායකයින්ට මුහුණ දීමට සිදුවන ගැටළු 02 ක් ලියන්න.
iii. ව්‍යවසායකත්ව භූමිකා සාර්ථක කර ගැනීමට ව්‍යවසායකයෙකු වර්ධනය කර ගත යුතු මූලික කුසලතා 04 ක් ලියන්න.
iv. අතීත ව්‍යාපාර හා සැසඳීමේ දී නූතන ව්‍යාපාර වල දැකිය හැකි ලක්ෂණ 02 ක් ලියන්න.
v. ව්‍යවසායකයෙකුට ආර්ථික පරිසරය හිතකරව බලපාන අවස්ථාවකට නිදසුනක් දෙන්න. (ලකුණු 02*5)

04. ව්‍යවසායකයින් තවමත් ප්‍රයෝජනයට නොගත් සම්පත් බොහොමයක් තවමත් අපේ රටේ පවතියි.

i. ව්‍යාපාරික කටයුතු සඳහා යොදා ගැනෙන මානව නොවන සම්පත් 02 ක් සඳහන් කරන්න.
ii. පරිසර ප්‍රවණතා වලට සංවේදී වීමෙන් ව්‍යවසායකයෙකුට ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න.
iii. නවෝත්පාදනයට මඟ පෙන්වන SCAMPER ආකෘතිය තුළ ඇති ක්‍රමවේද 02 ක් සඳහන් කරන්න.
iv. පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමෙන් ව්‍යවසායකයෙකුට ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න.
v. හොඳ ව්‍යාපාර අදහසක හා හොඳ ව්‍යාපාර අවස්ථාවක දැකිය හැකි ලක්ෂණය බැගින් ලියන්න. (ලකුණු 02*5)

05. කළමනාකරණ ක්ෂේත්‍රයේ සාර්ථකත්වයට සැලසුම් ඉතාම වැදගත් වේ.

i. ඔබේ පාසලේ දැකිය හැකි සැලසුම් 02 ක් සඳහා උදාහරණ දෙන්න.
ii. ව්‍යාපාරයකට සැලැස්මක් අවශ්‍ය වන්නේ ඇයි? හේතු 02 ක් ලියන්න.
iii. නිෂ්පාදිතය හා සම්බන්ධ අලෙවිකරණ උපායමාර්ග තේරීමේ දී ව්‍යාවසායකයා අවධානය යොමු කරන කරුණු 02 ක් ලියන්න.
iv. නිමි ඇඳුම් වෙළඳසැලක අලෙවි වියදම් සඳහා ගැනෙන අයිතම 02 ක් ලියන්න.
v. තේ කෝප්පයක් සකස් කර ගැනීම සඳහා භාවිත කෙරෙන යෙදවුම් 04 ක් ලියන්න. (ලකුණු 02*5)

06. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ලීම සඳහා විවිධ ව්‍යාපාර වල මැදිහත් වීමක් දක්නට ලැබේ. ඒ සඳහා එම ව්‍යාපාර විවිධ ආකාරයට සංවිධානය වෙයි.

i. ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම සඳහා පදනම් කර ගත හැකි නිර්ණායක 02 ක් ලියන්න.
ii. කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර වල දැකිය හැකි සමාන ලක්ෂණ 04 ක් ලියන්න.
iii. වරලත් ගිවිසුමක හා හවුල් ගිවිසුමක දැකිය හැකි පොදු එකඟතා 02 බැගින් ලියන්න.
iv. ව්‍යාවසායක සංස්කෘතියක් බිහිකර ගැනීමට රජයේ මැදිහත් වීම සිදුවිය යුත්තේ කේසේද? යෝජනා 02 ක් ඉදිරිපත් කරන්න.
v. ව්‍යවසායකයින් සමාජ වගකීම පිළිපැදිය යුත්තේ ඇයි? හේතු 02 ක් ඉදිරිපත් කරන්න. (ලකුණු 02*5)

07. කිනිතිගේ යෝගට් ව්‍යාපාරයේ පළමු මාසය සඳහා අපේක්ෂිත ආදායම් හා වියදම් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

විකුණුම් - රු.60 බැගින් කිරි යෝගට් 1000
රු.100 බැගින් පළතුරු යෝගට් 1000

කිරි මිලදී ගැනීම සඳහා	රු. 40 000.00
පළතුරු සහ අනෙකුත් ද්‍රව්‍ය වියදම්	රු.15 000.00
සේවක වැටුප්	රු.30 000.00
බෙදාහැරීමේ වියදම්	රු.28 000.00

3% වාර්ෂික පොලියට ලබා ගත් රු.100 000 බැංකු ණය

පළමු මාසය සඳහා ඉහත තොරතුරු ඇසුරින් අපේක්ෂිත ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛණය සකස් කර මුළු නිෂ්පාදන පිරිවැය හා නිෂ්පාදන නොවන පිරිවැය හා ශුද්ධ ලාභය දක්වන්න. (ලකුණු 10)

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank